
පුංචි දඟයා
ගහෙන් වැටිලා
රිසලි රෙහන්සා සුහසිංහ

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පුංචි දඟයා ගහෙන් වැටිලා.


පුංචි සමන් හරිම දඟයෙක්. එයාට ඒ හින්දා හැමෝම කිව්වේ දඟයා කියලා. එයා ඉස්කෝලේ ගිහිනුත් දඟ වැඩ කළා.





එයාගේ අක්කා තමයි සුමුදු. එයා හරිම අහිංසකයි. සුමුදු ඉගෙන ගන්නත් හරිම දක්ෂයි. එයාගේ

අම්මයි තාත්තයි කලේ හේන් ගොවිතැන.



ලොකු පුතේ තාත්තයි මමයි හේනට යනවා. රොටී හදලා ඇති. මල්ලී ඔයයි කාලා යන්න.

මල්ලිට ඇළට බහින්න දෙන්න එපා. “පරිස්සමට බලාගන්න.” හැමදාමත් වගේ අම්මා අදත් කිව්වා.



වෙනදා වගේම සුමුදුයි, සමනුයි ඉස්කෝලේ ගියා. ඉස්කෝලේ ඇරුනාම සුමුදුට මල්ලි සොයා ගන්නත් අමාරුයි. මොකද මල්ලි

එක තැනක ඉන්නේ නැහැ. රසික මල්ලි සමන්ව දැක්කද ? සුමුදු, මල්ලීගේ පන්තියේ තවත් ළමයෙකුගෙන් ඇහුවා.සුමුදු අක්කේ, එයා ළිඳ පැත්තට ගියා. වතුර බොන්න.





සුමුදුලා ඉස්කෝලේ
ඇරිලා ආවේ කැලෑ
පාරකින්. එතකොට
හැමදාම සමන්
කැලෑවේ
තියෙන
ගෙඩි වර්ග
කනවා. එදත්
අඹ ගහක් දැකලා
දුවගෙන ගියා.
''මල්ලී එපා ඒ ගහට
නගින්න''.

සුමුදු කෑ ගැහුවා. සමන්
කියන දේ අහන් නැතුව
ගහට නැංගා.අඹ ගෙඩියක්
කඩලා අක්කාට දැම්මා.

''ආ අක්කේ, එපා මල්ලී,



සමන් අක්කා කියනදේ අහන්නැතුව ගහේ උඩට නැංගා. එකපාරටම අත්ත කඩාගෙන වැටුණා.


මල්ලි... අක්කා හයියෙන් කෑ ගැහුවා. සුමුදු සමන් ළඟට දුවගෙන ගියා.

“අම්මේ රිදෙනවා” සමන් කෑ ගැසුවා. සුමුදු තවත් මාමලා දෙන්නෙක් එක්ක සමන්ව වෙද මාමා ළඟට අර ගෙන ගියා.

අම්මයි තාත්තයි වෙද මාමලාගේ ගෙදර ආවා.

“ මේ ළමයාගේ කකුල කැඩිලා. මාස තුන හතරක්වත් බෙහෙත් බඳින්න වෙයි.”

වෙද මාමා සමන් ගේ තාත්තාට



කිව්වා.



සමන්ට ඉස්කෝලේ යන්නත් බැරිවුණා. “අම්මේ මම ආයේ දඟ වැඩ කරන්නේ නැහැ.” සමන් අම්මාට පොරොන්දු වුණා. සමන්

හොඳ ළමයෙක් උනා. ආයෙත් ඉස්කෝලෙ ගියා.

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම සවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01